# මා ඔය මධ්‍ය නිම්නයේ පුළුටු මැටිරූප පිළිබඳ පුරාවිද්‍යාත්මක අධ්‍යයනයක්

ආර්.ඒ මධුසංඛ රණතුංග

පුරාවිද්‍යාව හා උරුම කළමනාකරණ අධ්‍යයනාංශය. ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය.

ප්‍රමුඛ පදඃ වැලිඔය නිම්නය, පුළුටු මැටිරූප, ටෙරාකොටා

## හැඳින්වීම

ග්‍රාමීය සංස්කෘතිය පෙන්නුම් කරන්නාවූ කලා මාධ්‍යයක් ලෙස පුළුටු මැටිරූප හඳුනාගතහැකි මෙම කලාව ග්‍රාමීය ඇදහිලි හා විශ්වාසයන් මත නිර්මාණය වන්නට ඇතැයි පුරාවිද්‍යාඥයන් අදහස් කරයි. මැටියෙන් තනා පුළුස්සා ඇති හෙයින් මෙම නිර්මාන පුළුටු මැටිරූප (tettacotta) ලෙසින් හඳුන්වයි. පුරාවිද්‍යා වදන් මාලාවට 'පුළුටු මැටිරූප' වන වදන හඳුන්වාදී ඇත්තේ ප්‍රිශාන්ත ගුණවර්ධන විසිනි (කුමාර.2016.155) ලංකාවේ විශාල ව්‍යාප්තියක් හඳුනාගත හැකි මෙම ග්‍රාමීය කලාව සීගිරිය, තබ්බෝව, ඇළහැර වව්නියාව, කිලිනොච්චිය, පදවිය, පඬුවස්නුවර, රාජංගනය ආදි ස්ථාන 41කින් මෙන්ම මුලතිව් දිස්ත්‍රික්කයෙන් ද පුළුටු මැටි රූප සාධක හමුවේ. මෙම අධ්‍යයනය සඳහා මා තෝරාගත්තේ උතුරු පළාතේ මුලතිව් දිස්ත්‍රික්කයේ වැලිඔය ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසයේ වැලිඔය පැරණි ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ තබා ඇති එකතුවයි. මා ඔය මධ්‍ය නිම්නයට අයත් වන මෙම ප්‍රදේශය පැරණි මානව ජනාවාස සාධක බොහොමයක් හඳුනාගත හැකි කලාපයකි. මෙලෙස තබා ඇති මැටිරූප වැලිඔය නිම්නයට අයත් විවිධ ගම්වලින් හමුවී ඇති අතර ඒවා රැස්කර තබා ඇත්තේ හිටපු ප්‍රාදේශිය ලේකම්වරයෙකු වූ නිරෝෂන් කරුණාතිලක මහතා විසිනි. ඔහු මේවා හමුවූ ස්ථාන පිළිබඳ සංක්ෂිප්ත වාර්තාවක් ද තබා ඇත. ප්‍රධාන වශයෙන් මෙම මැටිරූප හමුවූ ස්ථාන ලෙස කළ්‍යාණපුර 1 පියවර අංක 207 ඉඩමත් අංක 343 ඉඩමත් දක්වා ඇත. (කරුණාතිලක.2006-2011) අනෙකුත් මැටි රූප විවිධ ප්‍රදේශ වලින් ගැමියන් ගෙනැවිත් දුන් බව ඔහු සඳහන් කර ඇත. මෙම එකතුව තුළ ටෙරාකොටා ශීර්ෂ 16ක් ද බඳ කොටස් 12 ක් ද හඳුනාගත හැකිවිය. මා ඔය මධ්‍ය නිම්නයේ ජනාවාසකරණය හඳුනාගැනීමේ දී මෙම නිර්මාණ වැදගත් වන අතර තාක්ෂණය හඳුනාගැනීම, කලාත්මක අංග හඳුනාගැනීම, නිර්මාණ සිදුකල කාලසීමාව හඳුනාගැනීමත් අරමුණු කරගනිමින් මෙම පර්යේෂණය දියත් කෙරිණි.

## ක්‍රමවේදය

අධ්‍යයන ක්‍රමවේදයේ දී පුළුටු මැටි රූප පිළිබඳ මූලික අවබෝධයක් ලබාගැනීමටත් මෙම නිර්මාණ හමුවන සන්දර්භය හඳුනා ගැනිමත් අරමුණු කොට පූර්ව පර්යේෂණයන් මෙන්ම අනෙකුත් මූලාශ්‍ර පිළිබඳ පුස්තකාල අධයනයක් සිදු කෙරිනි. එමෙන්ම මෙම මැටිරූප දැනට හමුවන්නේ පැවති සන්දර්භයෙන් නොවන හෙයින් වැලිඔය හිටපු පාදේශීය ලේකම් නිරෝෂන් කරුණාතිලක මහතාගේ කෙටි වාර්තාව ද මූලාශ්‍ර ලෙස යොදා ගැනීමට සිදුවිය. දත්ත වාර්තා කිරීමට ක්ෂේත්‍ර අධ්‍යයනයත් සම්මුඛ සාකච්ඡා මගිනුත් දත්ත ලබා

ගැනිණි. දත්ත විශ්ලේෂණයේ දී ටෙරාකොටා මැටි රූප හමුවන අනෙකුත් ක්ෂේත්‍රයන් හා නිර්මාණ සමග සංසන්දනාත්මක අධ්‍යයනයක් සිදුකළ අතර මෙම මැටිරූප නිර්මාණය වූ කාලපරාසය හඳුනාගැනීමට සාපේක්ෂ කාලනිර්ණයන් භාවිත කිරීමට සිදු විය. දත්ත නිරූපණය කිරීමේ දී සැලසුම් හා ඡායාරූප භාවිතයට ගැනිණි. අධ්‍යයනයේ දී හමුවී ඇති සියළුම මැටිරූප හා කොටස් යොදාගැනිණි.

## ප්‍රතිඵල සාකච්ඡාව

මෙම පුළුටු මැටිරූප නිර්මාණය කිරීමේ දි භාවිත කල තාක්ෂණය හඳුනා ගැනීම වැදගත් මේ අනුව අමුද්‍රව්‍ය ලෙස යොදාගත් මැටි සාමාන්‍ය රතු දුඹුරු පස් අනා සකස් කර ඇති අතර මැටි පෙරා අපද්‍රව්‍ය ඉවත් කිරීමක් සිදුකර නැත. මන්ද යත් භායනයට ලක්වී ඇති රූප වල 4 mm හා ඊට අඩු ක්වාට්ස් හා මැංගනීස් (තෙල් බොරළු) කැබලි හඳුනාගත හැකිවේ. මැටි රූප පුලුස්සා ඇති අතර මතුපිට පැහැය අඳුරු රතු පැහැයක් ගනී. ප්‍රදේශයේ පසෙහි ඇති යකඩ ප්‍රතිශතය වැඩි හෙයින් එම පැහැය ලැබෙන්නට ඇත. නිර්මාණ තාක්ෂණය කෙරේ සලකා බැලීමේ දී මෙම මැටිරූප ඇතුලත කුහර සහිතව නිර්මාණය කර ඇත. නමුත් අච්චු භාවිත කල බවක් හඳුනාගත නොහැක. මන්ද යත් මෙම රූප වල කුහරය ඇත්තේ බඳ කොටසෙහි හා හිසෙහි පමණි. මෙම රූප සැකසීමේ දී අතින් හෝ සකපෝරුව ආධාරයෙන් මැටි නල සකස්කර එයට අත් පා වෙන ම සකස්කර පුරුද්දා ඇත. මෙවැනි මැටි නල 'තබ්බෝව සංස්කෘතිකමය මැටි රූප' හමු වූ වැල්ලේවල ප්‍රදේශයෙන් හමු වී තිබේ ( දිසානායක. 2004. 199). බොහෝ රූප වල උඩුකය පමණක් නිර්මාණය කර ඇති අතර එය යම්කිසි වේදිකාවක් මත සමබර ව තැබිය හැකිය. පාද සහිත එක් රූපයක් හමුවූ අතර එහි පාද ලංකරගෙන සිටින අයුරින් සාදා ඇති අතර මෙම පාද කොටස ද ඇතුලත කුහර සහිතව නිමවා ඇත. අනතුරු ව හිස නිර්මාණය කර ඇත මෙහි දී ක්‍රම දෙකක් ඒ සඳහා භාවිත කර ඇත. එනම් හිස වෙනම නිර්මාණය කර සිලින්ඩරාකාර බඳට සවි කිරීම හෝ සිලින්ඩරයේ ඉහළ කොටස ම ඇද කවාකාරව සකසා නිර්මාණය කිරීමයි. අනතුරු ව අත්. ඇස්. තොල්. පියයුරු හා ආභරණ වෙනම තනා බඳට පුරුද්දා ඇත. මීට අමතර ව කෙස් වස්ත්‍ර රේඛා මඟින් දක්වා ඇත. එනම් මැටි රූප වියලීමට පෙර කූරකින් මෙම රේඛා සටහන් දක්වා ඇත. ඒ අනුව මෙම පූළුටු මැටි රූප නිර්මාණයේ දි සරල තාක්ෂණයක් භාවිත කර ඇති අතර මූලිකව ම දැන පමණක් උපයෝගි කර ඇති බව හඳුනා ගත හැකිය. මෙම රූප වල යම් ආලේපයකින් වර්ණ ගන්වා ඇති අතර එය නිස්චිතව ම හඳුනාගත නොහැක. බොහෝවිට වර්තමාණයේ කුඹල්කාර්මිකයින් මැටිබඳුන්වල රතුපැහැය ලබාගැනීමට ආලේපකරන බොරළු පස් සෝදා පෙරාගන්නා රතු මැටි දියරයට සමාන ආලේපයක් විය හැකිය. විවිධ පරිමාණයන්ගෙන් නිර්මාණය කරඇති මෙම රූප සියල්ලක් ම සෙ:මී:15-30 ත් අතර උසින් යුක්ත වේ. මෙම පූළුටු මැටි රූප වල කලාත්මක ලක්ෂණයන් සලකා බැලීමේ දී බොහෝ විට මිනිස් සිරුරේ අවයවයන් දැක්වීම පමණක් සිදු කර ඇති බව පෙනේ. මන්ද යත් ඒවායේ තාත්වික සජීවී ලක්ෂණ මතුකිරීමට ශිල්පියා උත්සහ ගෙන නොමැත. නමුත් නිර්මාණ කිහිපයක පමණක් මුහුණේ ඉරියව් දක්වා ඇත. සමස්තයක් ලෙස මෙම මැටි රූප නිර්මාණයේ දී සිරුරේ හැඩය අවයව අතර පරිමාණය පිළිබඳ අවධානය යොමු කල බවක් නොපෙනේ. බොහෝ විට හිසත් කඳත් එකම පරිමාණයෙන් නිර්මාණය කර ඇත ගෙල වෙන්කර දක්වා ඇතත් බොහෝවිට එය උරහිස් හා එක සමාන පරිමාණයකින් සාදා ඇත. කඳට වඩා විශාල ව හිස නිර්මාණය කර

ඇති රූප ද හඳුනා ගත හැකිය. මූලික ව වැඩි අවධානයක් හිස නිර්මාණය කිරීමට යොදා ඇති අතර හිස් මුදුන උල් හැඩයක් ගනී. පිරිමි රූපවල විශේෂයෙන් මෙම ලක්ෂණය දකගත හැකි අතර එම රූපවල හිස මුඩුකර දක්වා ඇති අතර එක් රූපයක පමණක් රේඛා මගින් හිසකෙස් දක්වා ඇත. එසේ නොමැති නම් තලප්පාවක් වැනි හිස් පළඳනාවක් එක් කර තිබේ. කාන්තා හිස්වල විවිධ කොණ්ඩා මෝස්තර හා හිස් පළඳනා සහිතව නිමවා ඇති බව හඳුනාගැනීමට ලැබින. හිස්වල හැඩයන්ද ආකාර කිහිපයකින් හඳුනා ගත හැකිවිය. එනම්, වෘත්තාකාර, තිරස් ඉලිප්සාකාර, ඕවලාකාර, කේතු ආකාර ආදි හැඩ හඳුනාගත හැකිවේ. මුහුණේ අංග දක්වීමේ දී නාසය දක්වීමට ප්‍රමුඛ තැනක් දී ඇත. බොහෝවිට මුහුණට සාපේක්ෂ ව විශාල උල් නාසයක් මෙම පුළුටු මැටි රූපවල හඳුනාගත හැකිය. ඇහිබැම පැහැදිලි ව දක්වා ඇති අතර ඇස් වෙනම සකස් කර මුහුණට අලවා ඇත. කන් ද මෙලෙස ම වෙනම නිර්මාණය කර සවිකළ බව පෙනේ. සිරුරේ අංග දක්වීමේ දී කාන්තා හා පිරිමි රූප වෙන් කර හඳුනා ගත හැකි පරිද්දෙන් සිරුරේ ලක්ෂණයන් යම්තාක් දුරට පෙන්වා දී ඇත. කාන්තා රූපවල කෙස් වැටියක් ලෙස හෝ මුකුටයක් පැහැදිලිව දක්වා ඇති අතර පියයුරු දක්වීම ද මූලික ව හඳුනාගත හැකි ලක්ෂණයන් වේ. සියළුම පුළුටු මැටි රූපවල උඩුකය නග්න ව දක්වා ඇති අතර බහුතරයක් ම ඇත්තේ උඩුකය රූප පමණි. දැත් පැහැදිලි ව ඉතිරිව ඇත්තේ රූප දෙකක හෝ තුනක පමණි. ඒවා ඉනට තබාගෙන සිටින ඉරියව්වක් පෙන්නුම් කරයි. මීට අමතර ව මෙම පුළුටු මැටි රූප ආශ්‍රයෙන් පැරණි ජන සමාජය තුල භාවිතයට ගත් ආභරණ කිහිපයක්ද හඳුනාගැනීමට ලැබේ. ඒ අනුව වර්ග කිහිපයකට අයත් මාල වර්ග ඉන පළඳනා කර්ණාභරණ වළලු හා ශීර්ෂ පළඳනා හඳුනා ගත හැකිය.

ග්‍රාමීය සංස්කෘතිය පිළිබිඹු කරන්නා වූ කලා මාධ්‍යයක් ලෙස හඳුනාගත හැකි පුළුටු මැටි රූප පැරණි සමාජය අධ්‍යයනයේ දී වැදගත් වේ මන්ද තත්කාලීන සමාජ තත්වයන් ඇදහිලි පුදසිරිත් මෙන් ම ඇඳුම් පැලඳුම් ආභරණ පිළිබඳව ද යම් හෝ සාක්ෂීන් මෙමගින් පෙන්නුම් කරයි. මෙම වැලිඔය නිම්නයේ පුළුටු මැටිරූප ක්‍රමවත් අධ්‍යයනයක් හෝ කාලනිර්ණයක් සිදුකර නොමැති හෙයින් මේවා අයත් කාලවකවානුව තීරනය කිරීම අපහසු වේ. නමුත් මීට සමාන ලක්ෂණ සහිත මැටිරූප හමුවන තදාශ්‍රිත ප්‍රදේශ ලෙස පදවිය හා වව්නියාව සෙට්ටිකුලම හඳුනාගත හැකිය. සෙට්ටිකුලමෙන් හමුවන මැටිරූප ක්‍රි. ව. 10 ත් 12 අයත් බව හඳුනාගෙන තිබේ. පදවියෙන් හමුවන මැටිරූප කාලනිර්ණය කර නැතත් පදවියේ ඇති නටබුන් පොළොන්නරු යුගයට අයත් වේ. වැලිඔය මෙම ප්‍රදේශ දෙකට ආසන්න ව පිහිටා ඇති හෙයින් මෙම මැටිරූප පොළොන්නරු සමයට අයත් වේයයි සාපේක්ෂ ව උපකල්පන කල හැකිය.

## ආශ්‍රිත ග්‍රන්ථ


දිසානායක, සෙනරත්. (2004) *හත්තොට අමුණ පුරාවිද්‍යා ගවේෂණ :1990-1992.* **ගවේෂණ 1 කලාපය.** පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව. කොළඹ 07.

කුමාර, අනිල් සුරේෂ් (2016) *පුළුටු මැටිරූප නිර්මාණ තාක්ෂණය.* **Second Archaeological Research Symposium.** Department of Archaeology and Heritage Management. Rajarata Univesity of Sri Lanka

කරුනාතිලක නිරෝෂන්. *පෞද්ගලික සටහන්.* 2006-2011.අමුද්‍රිත